# Sri Lanka Tourism

**Sri Lanka Tourism Development Authority, 80, Galle Road, Colombo 03, Sri Lanka.**
Hotline: 1912 Tel: +94 11 2426800/900, Fax: +94 11 2437953 E-mail: info@srilanka.travel, Web: www.srilanka.travel / www.sltda.gov.lk

SLTDA/SQA/2024/07/01

2024/11/26

සුරාබදු කොමසාරිස් ජනරාල්
ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව
නො.353
කෝට්ටේ පාර
රාජගිරිය

<u>2025 වර්ෂයට අදාළ සුරාබදු බලපත්‍ර ලබාදීම සම්බන්ධයෙන්.</u>

2025 වර්ෂයට අදාලව සුරාබදු බලපත්‍ර නිකුත් කිරීම සම්බන්ධයෙන් 2024.11.26 වන දින පැවති සාකච්ඡාවේදී එළැඹි තීරණ පහත පරිදි දන්වා එවමි.

1. 2024 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් නිකුත් කරන ලද වලංගු ලියාපදිංචියක් හෝ බලපත්‍රයක් ලබාගෙන ඇති සංචාරක සේවා සපයන්නන් සඳහා 2025 වර්ෂයට අදාළ මත්පැන් බලපත්‍ර 2025.06.30 දින දක්වා සුරාබදු දෙපාර්තුමේන්තුව විසින් නිකුත් කිරීම.
2. 2025 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ බලපත්‍ර අලුත් කිරීම, 2025 ජූනි 30 දින හෝ ඊට පෙර සිදු කළ යුතු අතර එසේ බලපත්‍ර අලුත් කළ සංචාරක ආයතනයන් සඳහා පමණක් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් සුරාබදු දෙපාර්තමේන්තුව වෙත ඉදිරි කාලය සඳහා නිර්දේශ නිකුත් කිරීම.
3. 2025 ජූනි 30 දිනට පෙර ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් නිකුත් කරන ලද 2025 වර්ෂයට අදාළ බලපත්‍රය හා සුරාබදු නිර්දේශය ලබාගන්නා ලෙසට සංචාරක සේවා සපයන්නන්හට සුරාබදු දෙපාර්තමේන්තුව විසින්ද දැනුම් දීම.
4. සුරාබදු දෙපාර්තමේන්තුව විසින් බලපත්‍ර නිකුත් කිරීමට අදාළ කටයුතු ආරම්භයේදීම උක්ත කාරණා සම්බන්ධයෙන් හා ඒ හේතුවෙන් දැරීමට සිදුවන පිරිවැය සම්බන්ධයෙන් සංචාරක සේවා සපයන්නන් ලිඛිතව දැනුවත් කිරීම.

ඉහත සඳහන් තීරණයන් සම්බන්ධයෙන් ඔබගේ ලිඛිත අනුමැතිය කඩිනමින් ලබා දීමට කටයුතු කරන මෙන් කරුණාවෙන් දන්වා සිටිමු.

ස්තුතියි.

සභාපති
ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය.

පිටපත්:

1.ලේකම්, විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය
2.අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය
3.අධ්‍යක්ෂ, ප්‍රමිති හා තත්ත්ව ආරක්ෂණ, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය